Gmail

Tharindu Jayawardhana <tharindu.rti@gmail.com>

**තොරතුරු දැන ගැනීමේ පනත යටතේ කරනු ලබන ඉල්ලීමයි**
1 message

**Tharindu Jayawardhana** <tharindu.rti@gmail.com> Sun, Mar 6, 2022 at 1:12 PM
To: div.kegalle@police.lk

තොරතුරු නිලධාරී,
කොට්ඨාස භාර පොලිස් අධිකාරී කාර්යාලය,
කෑගල්ල.
div.kegalle@police.lk

**තොරතුරු දැන ගැනීමේ පනත යටතේ කරනු ලබන ඉල්ලීමයි**

අයදුම්කරුගේ නම - තරිඳු ජයවර්ධන

ලිපිනය - 176/3, ඔරුතොට, ගම්පහ.

ඊමේල් - tharindu.rti@gmail.com

තොරතුරු අවශ්‍ය වන කාල පරිච්ඡේදය - 2021 ජූලි පළමු වැනිදා සිට 2021 දෙසැම්බර් 31 වැනිදා දක්වා

තොරතුරුවලට අදාලවන ආයතන - පොලිස් කොට්ඨාසයේ සියලුම පොලිසි

අවශ්‍යවන තොරතුරු -
1) කොපමණ උද්ඝෝෂණ සහ/හෝ විරෝධතා සහ/හෝ සැමරීම් ප්‍රමාණයකට විරුද්ධව අධිකරණයට කරුණු වාර්තා කර ඇත්ද?
2) එලෙස කරුණු වාර්තා කළ අධිකරණය සහ නඩු අංක ලබා දෙන්න.
3) එම කරුණු වාර්තාකිරීම්වලට අදාලව තහනම් නියෝග ලබා ගත් සංඛ්‍යාව සහ ඊට අදාල නඩු අංක ලබා දෙන්න.
4) එම නඩුවලට අදාලව අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන සහ සැකකරුවන්ගේ නම් ඒ ඒ නඩුවට අදාලව වෙන් වශයෙන් ලබා දෙන්න.
5) ඒ ඒ නඩුවට අදාලව කරුණු වාර්තා කළ පනත/නීතියක කුමන වගන්තියක් අනුවද යන්න වෙන් වශයෙන් ලබා දෙන්න.
6) එම නඩුවලින් කොපමණ සංඛ්‍යාවක් අවසන් වී තිබේද? නඩුවේ තීන්දුව කුමක්වීද සහ එම නඩු මොනවාද යන්න වෙන් වශයෙන් ලබා දෙන්න.
7) එම නඩුවලට අදාලව චෝදනා පත්‍ර ගොනු කළ නඩු සංඛ්‍යාව කොපමණද? ඒ මොනවාද?

අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකි

දිනය - 2022/03/6

ඇමුණුම 03

RTI 02

### තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම

ලි.ප අංකය : SV/1.02/2022 (04/2022)

දිනය: 2022.03.08

තරිඳු ජයවර්ධන ........ මයා/~~මිය~~

176/3

බරුරතොට,

ගම්පහ.

ඔබ විසින් 2022.03.06 දින එවන ලද පහත දැක්වෙන තොරතුරු ඉල්ලීම ලැබුණු බව 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනිමේ අයිත්වාසිකම් පිළිබඳ පනතේ 24(3) වගන්තිය පරිදි මෙයින් දන්වා සිටිමි.

2021.07.01 දින සිට 2021.12.31 දින දක්වා කෑගල්ල කොට්ඨාශය තුළ සිදු කල උද්ඝෝෂණ හෝ විරෝධතා හෝ සාමරිච් වලට විරුද්ධව ගෙන ඇති අධිකරණ ක්‍රියාමාර්ග සම්බන්ධව

මෙම අයදුම් පත්‍රය ගැන ගනු ලබන ඉදිරි පියවර දින 14ක් තුළ ඔබට දන්වා එවනු ලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර ලබා ගැනිම උදෙසා පහත අත්සන් තබා ඇති අය, කාර්යාල වේලාවන් තුළදි ඔබට ඇමතිය හැකිය. විමසිම කරන සෑම අවස්ථාවකදිම ඉහත ලියාපදිංචි අංකය සඳහන් කිරිමට කටයුතු කරන්නේ නම් මැනවි.

නම :- කේ.බී. කීර්තිරත්න

තනතුර :- ජේෂ්ඨ පො. අධිකාරී

කාර්යාල දුරකථන අංක :- 035-2222382

ජංගම දුරකථන අංකය :- ........

(අත්සන)

තොරතුරු නිලධාරි(අත්සන)

කේ. බී. කීර්තිරත්න
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
කෑගල්ල කොට්ඨාසය

පොලිස් අධිකාරි
பொலிஸ் அத்தியட்சகர்
Superintendent of Police | 035- 2222228
ෆැක්ස්
பெக்ஸ்
Fax | 035- 2222121
විද්‍යුත් තැපෑල
e - mail | div.kegalle@police.lk

මගේ අංකය
எனது இல
My No | KE/SP/SV/102/2022 (04/2022)

ඔබේ අංකය
உமது இல
Your No |

දිනය
திகதி
Date | 2022.03.22

# පොලිස් අධිකාරි කාර්යාලය - කෑගල්ල
# பொலிஸ் அத்தியட்சகர் காரியாலயம் - கேகாலை
# Office of Superintendent of Police - Kegalle

තරිඳු ජයවර්ධන මහතා,
176/3,
ඔරුතොට,
ගම්පහ.

මහත්මයාණනි,

<u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව තොරතුරු ලබා දීම සම්බන්ධව.</u>

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත ප්‍රකාරව තොරතුරු ලබා ගැනීම යටතේ ඔබ විසින් 2022.03.06 දිනැතිව ඉදිරිපත් කර ඇති අයදුම්පත හා සබැඳේ.

ඒ අනුව 2021 ජූලි මස 01 දින සිට 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා කාලයට අදාළව ඔබගේ අයදුම්පතෙහි අනු අංක 1 සිට 7 දක්වා විමසා ඇති තොරතුරු පහත පරිදි ඔබ වෙත ඉදිරිපත් කරමි.

- <u>කෑගල්ල මූලස්ථාන පොලිසිය</u>
  1. 04 යි.
  2. 2021.07.08 ඒ.ආර්. 1020/21 කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණය
     2021.08.04 ඒ.ආර්. 1173/21 කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණය
     2022.08.05 ඒ.ආර්. 1187/21 කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණය
     2021.08.09 බී 1238/21 කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණය
  3. ඉහත සඳහන් විරෝධතා කිසිවකට තහනම් නියෝග නිකුත් කර නොමැති.
  4. ඉහත නඩු වලට අදාළව කිසිදු සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන නොමැත.
  5. 2021.07.08 දින ඒ.ආර්. 1020/21 - අංක 15 අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 106 (1)
     2021.08.04 දින ඒ .ආර්. 1173/21 - අංක 03 දරණ නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත සහ 1925 අගෝස්තු 25 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රය හා 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 107 හා 22 යටතේ
     2021.08.05 දින ඒ.ආර්. 1187/21 - 1976 අංක 15 අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 106 (01) හා 1897 අංක 03 දරණ නිරෝධායන හා රෝග වැළැක්වීම මේ ආඥා පනත සහ 1925 අගෝස්තු 25 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රය යටතේ

2021.08.09 දින බී 1238/21 - ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 140, 185, 332, 264 හා 1897 අංක 03 දරණ නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත 04 හා 05 යටතේ

6. නඩු 03 ක් අවසන්ව ඇත.

2021.07.08 ඒ.ආර්. 1020/21
2021.08.04 ඒ.ආර්. 1173/21
2021.08.05 ඒ.ආර්. 1187/21
ඉහත නඩු 03 සඳහාම තහනම් නියෝග නිකුත් කිරීම ගරු අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇති බැවින් අදාළ දිනයේදීම නඩු අවසන් කර ඇත.

2021.08.09 බී 1238/21 දරණ නඩුවේ සැකකරුවන්ට නොතීසි නිකුත් කර ඇති අතර නැවත කැඳවීම 2022.03.23 වන දිනට නියමිතව ඇත.

7. ඉහත කිසිදු නඩුවකට මෙතෙක් චෝදනාපත්‍ර ගොනු කර නොමැත.

- <u>වරකාපොල පොලිස් ස්ථානය</u>
  1. 01 යි
  2. බී 360/2021 වරකාපොල මහේස්ත්‍රාත් අධිකරණය
  3. තහනම් නියෝග නිකුත් කර නොමැත.
  4. කිසිදු සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන නොමැත.
  5. 1857 අංක 03 දරණ නිරෝධායන පනතේ අංක 01, 03, 04, 05 වගන්ති යටතේද ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 146, 262, 263 වගන්ති අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 22, 106(1), 107 වගන්ති යටතේ
  6. තහනම් නියෝග නිකුත් කිරීම ගරු අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇති බැවින් අදාළ දිනයේදීම නඩුව අවසන් කර ඇත.
  7. චෝදනා පත්‍ර ගොනු කර නොමැත.

තවද ඉහත පොලිස් ස්ථානයන්ට අමතරව කෑගල්ල කොට්ඨාශ අයත් මාවනැල්ල, රඹුක්කන, හෙම්මාතගම, පින්දෙනිය, අරණායක, ඇදිගම හා දේවාලේගම යන පොලිස් ස්ථානයන්හි 2021 ජූලි මස 01 දින සිට 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා කාලයට අදාළව ඔබ විසින් විමසා ඇති තොරතුරු වලට අදාළව කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැති බව වැඩිදුරටත් ඔබ වෙත දන්වා සිටිමි.

ස්තූතියි !

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
කෑගල්ල කොට්ඨාශය

කේ. බී. කීර්තිරත්න
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
කෑගල්ල කොට්ඨාසය